# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,414 - 2024 දෙසැම්බර් මස 06 වැනි සිකුරාදා - 2024.12.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 3034 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 දෙසැම්බර් මස 27 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 දෙසැම්බර් මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


3031 - B 82633 — 5,403 (2024/12)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**මුදල් . ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරි (සිවිල්), තාක්ෂණ නිලධාරි (විදුලි) තනතුරු සඳහාවන බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024**

1. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර සේවා ගණයේ තාක්ෂණික නිලධර තනතුරු 02ක් සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු හා තනතුරුවල රාජකාරි ස්වභාවය

| *අනුමත තනතුරු නාමය* | *තනතුර අනුමත ශ්‍රේණිය* | *අනුමත තනතුරු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|---|
| තාක්ෂණ නිලධාරි (සිවිල්) | (III,II,I) | 01 | 1. දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලිවල නඩත්තු කටයුතු හා ජල නළ පද්ධතියේ නඩත්තු කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යෑම.<br>2. වැඩ ඇස්තමේන්තු පිළියෙල කිරීම, පරීක්ෂා කිරීම හා සහතික කිරීම.<br>3. අදාළ අවස්ථාවල දී වැඩබිම් කරා ගොස් ඒවායේ නිරවද්‍යතාවය හා ප්‍රගති පරීක්ෂාව, පසු විපරම හා ඒවාට අදාළ වාර්තා ඉදිරිපත් කිරීම.<br>4. ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධ මිල විශ්ලේෂණය කිරීම, මිල විචලනය අනුව ඇස්තමේන්තුවල වෙනස්වීම් පරීක්ෂා කිරීම හා සහතික කිරීම.<br>5. ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට අනුව භෞතික හා මුල්‍යමය ප්‍රගතිය එක් එක් ව්‍යාපෘතීන් සඳහා පරීක්ෂා කොට එහි පසුබෑමක් ඇත්නම් ඒවාට හේතු ඉදිරිපත් කිරීම.<br>6. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| තාක්ෂණ නිලධාරි (විදුලි) | (III,II,I) | 01 | 1. ගොඩනැගිලි ඉදි කිරීමේ දී හා නඩත්තු කිරීමේ දී අවශ්‍යවන විදුලි ඉංජිනේරුමය කාර්යයන්ට අදාළ මූලික විමර්ශන, නිර්මාණ හා සැලසුම් පිළියෙල කිරීම මත වැඩ අධීක්ෂණය<br>2. විදුලි ඉංජිනේරුමය කාර්යයන්ට අදාළ ඇස්තමේන්තු සකස් කිරීම, මිල විශ්ලේෂණය කිරීම.<br>3. බිල්පත් පරීක්ෂා කිරීම, නිර්දේශ ලබාදීම.<br>4. දෙපාර්තමේන්තු ගොඩනැගිලි සඳහා ඇති විදුලි හා යාන්ත්‍රික ක්ෂේත්‍රවලට අයත් යටිතල පහසුකම් පරීක්ෂා කර බැලීම, කළ යුතු නඩත්තු කාර්යයන් පවත්වාගෙන යාම හා ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදීම.<br>5. සම්මත පිරිවිතර අනුව ප්‍රසම්පාදන ලිපිලේඛන පිළියෙල කිරීම.<br>6. විදුලි ඉංජිනේරුමය කාර්යයන්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා ඒවායේ පසුබෑමක් දක්නට ලැබේ නම් ඊට හේතුගෙන ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදීම.<br>7. ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන වෙනත් රාජකාරි. |

1.2 පත්කරනු ලබන සංඛ්‍යාව 02 කි. පත්වීම ක්‍රියාත්මකවන දිනය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

2. *බඳවා ගැනීමේ ක්‍රමය :*

2.1 ලිඛිත විභාගය.- මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ.

(i) බුද්ධි පරීක්ෂණය.
(ii) විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයකි.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- ලකුණු ලබා දෙනු නොලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් සඳහා පවත්වනු ලැබේ. මෙම බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙ හි සඳහන් සුදුසුකම් සපුරා තිබේ දැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම.

3. *වැටුප් පරිමාණය* :- 2016.02.25 දිනැති අංක : 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 31,040-10x445-11x660-10x730-10x750-රු. 57,550 (MN 03) වේ.

ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

4. *සේවා කොන්දේසි* :-

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංකඃ 1426/34 සහ 2006.01.06 වැනි දින දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් සේවයේ III වැනි ශ්‍රේණියට පත්කරනු ලැබේ.

4.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. 2016.01.01 දින හෝ එදිනට පසු රාජ්‍ය සේවයට බඳවා ගනු ලැබූ නිලධාරීන්, ඔවුන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නිලධර සේවයේ III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ඇතුළත ශ්‍රී ලංකා තාක්ෂණික සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

5. *බඳවා ගැනීමේ සුදුසුකම්* :-

5.1 අධ්‍යාපන සුදුසුකම් :

5.1.1 විද්‍යාව/ගණිතය/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (03), අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම.

5.1.2 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

5.2 වෘත්තීය සුදුසුකම් :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ කුසලතාවයක් පහත සඳහන් පරිදි තනතුරට අදාළව ලබා තිබිය යුතුය.

5.2.1 පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව ;

*හෝ*

5.2.2 ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව ;

*හෝ*

5.2.3 උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයට අනුබද්ධ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන මගින් පිරිනමනු ලබන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව ;

*හෝ*

5.2.4 ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ;

*හෝ*

5.2.5 උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.3 කායික සුදුසුකම් : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.4 වෙනත් සුදුසුකම් :

(1) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(2) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(3) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට, දක්වා ඇති සියලුම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(4) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(5) සේවයට බඳවා ගැනීම සඳහා අවශ්‍යවන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

6. *වයස :*

| | |
|---|---|
| අවම සීමාව | : අවුරුදු 18 ට නොඅඩු |
| උපරිම සීමාව | : අවුරුදු 30 ට නොවැඩි |

(ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2006.12.05 දින හෝ ඊට පෙර හා 1994.12.06 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

7. *විභාග ගාස්තු* - විභාගය සඳහා වූ ගාස්තුව රුපියල් 1,000.00 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර දිවයිනේ පිහිටි ලංකා බැංකු ශාඛාවක දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා නමින් පවතින තැපොබේන් ශාඛාවේ ගිණුම් අංක 7041552 දරන ගිණුමට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. බැංකු ශාඛාවෙන් ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙ හි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ.

8. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* -

8.1 ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2"× 12" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. 1.0 සිට 2.12 තෙක්වන ශීර්ෂ ඉල්ලුම්පත් කඩදාසියේ පළමුවන පිටුවේ ද, 3.0 සිට 5.0 තෙක් එහි දෙවෙනි පිටුවේ ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන පරිද්දෙන් තම ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. තව ද, සුදුසුකම් වලට අදාළ සහතික පත්‍රවල පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතු අතර එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම

ප්‍රයෝජනවත් විය හැකිය.) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

8.2 ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් ම විය යුතුය.

8.3 විභාගය සඳහාවන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2025.01.06 වැනි දින** හෝ ඊට පෙර හෝ ලැබෙනු පිණිස "දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02" යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ පැහැදිළිව "දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නිලධර සේවා ගණයේ සඳහාවන බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024" ලෙස විභාගයේ නම ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

8.4 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු. ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360/= කට (6 /2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ I උපලේඛනය අනුව මාසිකව රු. 41,580/= කට) වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය. රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන්ගේ අත්සන තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සහතික කරනු ලැබිය යුතුය.

8.5 සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.6 ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ.

9. විභාගයට ඇතුලුවීම :

9.1 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද (අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද) සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාගය පවත්වනු ලබන ආයතනය විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9.2 අපේක්ෂකයෙකු තමාට නියමකර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපතිවරයා වෙත භාරදිය යුතුය. සෑම අපේක්ෂකයෙකු ම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රය ආරම්භයේ පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

***සටහන*** - අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පුකර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත :

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත්කර ඇති ජාතික හැඳුනුම්පත,

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. සාවද්‍ය තොරතුරු සැපයීම - අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත්කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත්කර ඇති බව හෙළිවුවහොත්,

එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යයඃ-

(අ) විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍යයන්ගෙන් පමණක් පවත්වනු ලැබේ.

*සටහනඃ-*

(i) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(ii) තම ඉල්ලුම්පත්‍රයෙ හි සඳහන් විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ.

14. බඳවා ගැනීමේ ක්‍රමය -

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් වූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල මත බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනයකර සුදුස්සන් තෝරාගනු ලැබේ.

14.1 ලිඛිත විභාගය

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| i. බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ii. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

අපේක්ෂකයින් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු ය.

14.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයඃ

(i) ඉහත අංක 06 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේ ද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් පත්කරනු ලැබේ.

(iii) එක් එක් විෂයය සඳහා අවම වශයෙන් ලකුණු හතලිහක් (40) හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් සියළුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගයෙන් ඔවුන් විසින් ලබාගත් කුසලතා අනුපිළිවෙල හා බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව අනුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත පරිදි තීරණය කරනු ලබන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හි දී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

*සැළකිය යුතුයි ඃ*

සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගිවීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සළකනු නොලැබේ.

14.3 පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේ දී සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙලින් මෙම සේවයේ තුන (III) ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

14.4 ප්‍රතිඵලඃ

*ගැසට් නිවේදනයේ* 14.1 ඡේදයට අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයින් විභාගයේ දී ලබා ගන්නා මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම කරනු ඇත.

15. ලිඛිත විභාගයේ විෂය නිර්දේශය ඃ-

| *තනතුර* | *ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය* | *විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|---|
| තාක්ෂණ නිලධාරි (සිවිල්/ විදුලි) | 1. බුද්ධි පරීක්ෂණය | නිර්මාණාත්මක චින්තන ශක්තිය, ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමණාකරණය මැන බැලීමට අදාළ කෙටි ප්‍රශ්න පත්‍රයකි. | පැය 02 | 100 | 40% |
| | 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | තනතුරට අදාළ තාක්ෂණික දැනුම හා විෂය දැනුම මැන බලන ප්‍රශ්න 08කින් ප්‍රශ්න 05ක් සඳහාම සමාන ලකුණු ලබා දෙනු ලැබේ. | පැය 02 | 100 | 40% |

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

ඩබ්. ඒ. සේපාලිකා චන්ද්‍රසේකර,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2024 නොවැම්බර් මස 13 දින,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරි (සිවිල්/විදුලි)
තනතුරු සඳහා බඳවා ගැනීම - 2024

1. පෞද්ගලික තොරතුරු ඃ

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදාහරණ ඃ HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA.)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම ඃ
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදාහරණ ඃ GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.

3. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1

4. විවාහක/අවිවාහක බව :
අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 2

5. ජන වර්ගය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(සිංහල -1, දෙමළ - 2, මුස්ලිම් - 3, වෙනත් - 4)

6. ජාතික හැඳුනුම්පත් අංකය :

7. උපන් දිනය

වර්ෂය මාසය දිනය

8. සුදුසුකම් සැපිරිය යුතු අවසාන දිනට වයස

(2024.12.06 දිනට)

අවුරුදු මාස දින

9. දුරකථන අංකය :

මුදල් ගෙවූ ලදුපත නොගැළවෙන සේ එහි එක් දාරයකින් මෙහි අලවන්න.

10. අධ්‍යාපන සුදුසුකම්
අ.පො.ස.(සා.පෙළ)
(1) විභාගයේ වර්ෂය :————.
(11) විභාග අංකය :————.
(111) විභාග ප්‍රතිඵල :

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස.(උ.පෙළ)

(i) විභාගයේ වර්ෂය :————.

(ii) විභාග අංකය :————.

(iii) විභාග ප්‍රතිඵල :

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |

11. *වෘත්තීය සුදුසුකම් :* ...........................................................................................
...........................................................................................
...........................................................................................
...........................................................................................
...........................................................................................
...........................................................................................

12. ඔබ රජයේ සේවයේ තනතුරකින් විනයානුකූල හේතූන් මත පහකිරීමක් හෝ කිසියම් වරදක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී ඇත්නම් හෝ ඒ හා සම්බන්ධ සියලුම විස්තර :-
...........................................................................................
...........................................................................................

13. *අයදුම්කරුගේ සහතිකය :*

(i) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ නිවැරදි ලෙස සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ප්‍රකාශ කරමි.

(ii) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකුවන බවත්, පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමටත් යටත්වන බව මම දනිමි.

(iii) අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීම් නිවේදනයේ සියලු කරුණු ඉතා හොඳින් කියවා අවබෝධ කරගත් බවත්, එහි සඳහන් සියලු කරුණු හා කොන්දේසිවලට එකඟවන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

14. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................................... මයා /මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී .................. දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි.)

15. *ආයතන ප්‍රධානියාගේ සහතිකය :* (රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ............................ (සම්පූර්ණ නම) යන අය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ............................ සේවයේ ............ ශ්‍රේණියේ ස්ථිර තනතුරක සේවය කරන බවත්, ඔහු/ඇය මොනම ආකාරයක විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන)

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

12-08

---

**අධ්‍යාපන අමාත්‍යාංශය - නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අංශය**

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය

**2025 පළමු අර්ධ වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම**

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ දිවයින පුරා පිහිටි ජාතික වෘත්තීය පුහුණු ආයතන, දිස්ත්‍රික් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයන් හි හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක අනෙක් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයන් හි ක්‍රියාත්මක කරනු ලබන වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා 2025 පළමු අර්ධ වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීම දැන් ආරම්භ කර ඇත. එම වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයන් හි ක්‍රියාත්මක NVQ (ජාතික වෘත්තිය සුදුසුකම්) පාඨමාලා හා NVQ නොවන පාඨමාලා සංකේත අංක යටතේ පහත දක්වා තිබේ. NVQ මට්ටම හා පාඨමාලා කාලය ද සඳහන් කර ඇත.

*පාඨමාලා විස්තර දැනගැනීම සහ පාඨමාලා සඳහා අයදුම් කිරීම :*

1. පාඨමාලා පිළිබඳ වැඩි විස්තර පහත දක්වන ලද ක්ෂණික දුරකථන අංකයන්ගෙන්/දිස්ත්‍රික් දුරකථන අංකයන් මගින් හා අපගේ Whatsapp දුරකතනය හා සම්බන්ධ SMS පණිවිඩ යොමු කිරීමෙන් ලබා ගත හැකිය.
2. ඔබ දිස්ත්‍රික්කයට ආසන්නතම වෘත්තිය පුහුණු අධිකාරියේ දිස්ත්‍රික් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය/ජාතික වෘත්තීය පුහුණු ආයතනයට හෝ ග්‍රාමීය මධ්‍යස්ථානයට ගොස් අයදුම්පත් භාර දිය හැකිය.
3. පහතින් දක්වන ලද වෙබ් පිටුවට ගොස් මාර්ගගත (Online) ක්‍රමවේදය යටතේ ද පාඨමාලා සඳහා අයදුම් කළ හැකිය.

| | | |
|---|---|---|
| පාඨමාලා ආරම්භය | - | 2025 ජනවාරි 02 |
| වැඩි විස්තර සඳහා | - | |
| දුරකතන අංක (ක්ෂණික) | - | 011-7270270 |
| | | 011-7277888 |
| | | 070-6767696 (Whatsapp) |

ඊ-මේල් ලිපිනය - cgip@vtasl.gov.lk
වෙබ් ලිපිනය - www.vtasl.gov.lk
ෆේස්බුක් පිටුව - www.facebook.com/vta

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය,
4 වන මහල, නිපුණතා පියස,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05

*ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ :-*

- නිපුණතා පාදක පුහුණුව (CBT) යටතේ පාඨමාලා හැදෑරීම
- ජාතික වෘත්තිය සුදුසුකම් සහතිකය (NVQ) මට්ටම 03 හා 04 ලබා ගැනීමෙන් පසු ඩිප්ලෝමා හා තාක්ෂණ උපාධිය ලබා ගැනීමේ අවස්ථාව
- තෝරාගත් පාඨමාලා සඳහා මාසික දීමනාවක්
- සහනදායී මුදලකට ලංගම ප්‍රවේශ පත්‍ර
- වෘත්තීය උපදේශන සේවාව හා වෘත්තිය ඉංග්‍රීසි දැනුම
- ව්‍යවසායකත්ව දැනුම
- ශිල්පීය ප්‍රවර්ධන දැනුම
- රජයේ පිළිගත් සහතිකයක්
- මාසික දීමනාවක් සමගින් වැඩිපුර පුහුණුව
- විදේශීය/දේශීය රැකියා සඳහා යොමු කිරීම
- ස්වයං රැකියා සඳහා යොමු කිරීම
- කුඩා හා මාධ්‍යම පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ව්‍යවසායකත්ව පුහුණුව සමග ණය පහසුකම් සඳහා යොමු කිරීම
- ව්‍යාපාර උපදේශන සේවා
- ක්ෂේත්‍රයේ ශිල්පීය නිපුණතාවය වර්ධනය කිරීමේ වැඩමුළු මගින් දැනුම යාවත්කාලීන කිරීම
- වෘත්තිය අධ්‍යාපනය තුළින් කාර්මික ක්ෂේත්‍රයේ උපාධියක් ලබාගැනීමේ අවස්ථාව

**ආදර්ශ අයදුම් පත්‍රය**

***ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය***

2025 පළමු අර්ධ වර්ෂය සඳහා ආධුනිකයන් බඳවා ගැනීම

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :.......................................................
2. ලිපිනය :.......................................................
3. පදිංචිය :.......................................................
   i. ග්‍රාමසේවා වසම :.......................................................
   ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.......................................................
   iii. දිස්ත්‍රික්කය :.......................................................
4. දුරකතන අංකය :.......................................................
5. උපන් දිනය :.......................................................
6. ජාතික හැඳුනුම්පත් අංකය :.......................................................
7. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම :.......................................................

8. ඔබගේ රුචිකත්වය හා සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා හා මධ්‍යස්ථාන අනුපිළිවෙලින් සඳහන් කරන්න.

| *පාඨමාලාව* | *අදාළ මධ්‍යස්ථානය* |
|---|---|
| (i) | (i) |
| (ii) | (ii) |
| (iii) | (iii) |

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඔබගේ අයදුම්පත පාඨමාලාව තෝරාගත් දිස්ත්‍රික්කයේ ආසන්නතම මධ්‍යස්ථානය වෙත ගොස් භාර දිය හැක. පාඨමාලා ආරම්භය 2025 ජනවාරි 02 වේ.

**ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය**

ආධුනිකයන් බඳවා ගැනීම - 2025 පළමු අර්ධ වර්ෂය

| *පාඨමාලා අංකය* | *වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා* | *පාඨමාලා කාලය* | *NVQ Levels* |
|---|---|---|---|
| | **තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය** | | |
| 1 | Adobe Certified Professional/Graphic Designer | 6m | IV |
| 2 | CISCO CCNA/Network Technician | 1,440Hrs | IV |
| 3 | National Certificate - Computer Hardware and Network Technician with CISCO IT Essential (A+) | 12m | IV |
| 4 | National Certificate - Computer Hardware Technician<br>පරිගණක දෘඩාංග ශිල්පි - ජාතික සහතිකය | 6m | IV |
| 5 | National Certificate - Computer Hardware Technician with CISCO IT Essential/A Plus | 6m | IV |
| 6 | National Certificate - Graphic Designer<br>චිත්‍රක ශිල්පි - ජාතික සහතිකය | 6m | IV |
| 7 | National Certificate - Graphic Designer (Hearing impaired)<br>චිත්‍රක ශිල්පි (ශ්‍රවණාබාධිත) - ජාතික සහතිකය | 6m | IV |
| 8 | National Certificate - Web Developer | 6m | IV |
| 9 | National Certificate - Information and Communication Technology Technician<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | 6m | IV |
| 10 | National Certificate - Information and Communication Technology Technician NVQ Level 3<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය (CAA) | 360Hrs | III |
| 11 | National Certificate - Software Developer<br>මෘදුකාංග සංවර්ධන - ජාතික සහතිකය | 12m | IV |

| පාඨමාලා අංකය | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | පාඨමාලා කාලය | NVQ Levels |
|---|---|---|---|
| 12 | National Diploma in Information and Communication Technology at NVQ Level 5<br>තොරතුරු හා සංනිවේදන තාක්ෂණවේදය - ජාතික ඩිප්ලෝමාව | 12m | V |
| | **මෝටර්රථ අලුත්වැඩියාව සහ නඩත්තුව** | | |
| 13 | Driver Training (Light Vehicle)<br>රියදුරු (සැහැල්ලු වාහන) | 4m | Non |
| 14 | National Certificate - Automobile Air Conditioning Technician<br>මෝටර්රථ වායු සමීකරණ තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | 12m | IV |
| 15 | National Certificate - Automobile Electrician<br>මෝටර්රථ විදුලි කාර්මික ශිල්පි - ජාතික සහතිකය | 6m | III |
| 16 | National Certificate - Automobile Mechanic<br>මෝටර්රථ කාර්මික ශිල්පි - ජාතික සහතිකය | 18m | IV |
| 17 | National Certificate - Automobile Technician<br>මෝටර්රථ තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | 18m | IV |
| 18 | National Certificate - Automobile Painter<br>මෝටර්රථ පින්තාරු ශිල්පි - ජාතික සහතිකය | 6m | IV |
| 19 | National Certificate - Automobile Tinker<br>මෝටර්රථ වැද්දුම් ශිල්පි - ජාතික සහතිකය | 6m | III/IV |
| 20 | National Certificate - Motorcycle Mechanic<br>යතුරුපැදි කාර්මික ශිල්පි - ජාතික සහතිකය | 6m | III/IV |
| 21 | National Certificate - Upholsterer<br>වාහන කුෂන්කරු - ජාතික සහතිකය | 6m | III |
| | **ආහාර තාක්ෂණය** | | |
| 22 | National Certificate - Baker/Commis I (Pastry and Bakery)<br>බේකරි ශිල්පි - ජාතික සහතිකය | 6m | IV |
| | **හෝටල් හා සංචාරක** | | |
| 23 | National Certificate - Barista | 6m | III |
| 24 | National Certificate - Professional cookery<br>වෘත්තීය සූපවේදී - ජාතික සහතිකය | 6m | IV |
| 25 | National Certificate - Food and Beverage Associate<br>ආහාර හා පාන සහකාර - ජාතික සහතිකය | 6m | IV |
| 26 | National Certificate - Guest Relation Officer<br>ආගන්තුක සම්බන්ධතා නිලධාරි - ජාතික සහතිකය | 6m | IV |
| 27 | National Certificate - Quick Service Restaurant (QSR) Crew Member<br>ඉක්මන් සේවා ආපනශාලා කාර්යය මණ්ඩල සාමාජික - ජාතික සහතිකය | 4m | IV |
| 28 | National Certificate - Room Attendant<br>කාමර සේවක - ජාතික සහතිකය | 3m | III |
| | **ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | | |
| 29 | National Certificate - Aluminium Fabrication with Interior Decoration<br>ඇලුමිනියම් පිරිසැකසුම් සහ අභ්‍යන්තර අලංකරණ ශිල්පි - ජාතික සහතිකය | 12m | IV |
| 30 | National Certificate - Aluminium Fabricator<br>ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පි - ජාතික සහතිකය | 6m | III/IV |
| 31 | National Certificate - Construction Craftsman (Masonry)<br>ඉදිකිරීම් ශිල්පි (පෙදරේරු) - ජාතික සහතිකය | 6m/12m | III/IV |

| පාඨමාලා අංකය | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | පාඨමාලා කාලය | NVQ Levels |
|---|---|---|---|
| 32 | National Certificate - Plumber<br>ජලනල ශිල්පි - ජාතික සහතිකය | 6m/12m | III/IV |
| 33 | National Certificate - Quantity Surveying Assistant<br>සහකාර ප්‍රමාණ සමීක්ෂක - ජාතික සහතිකය | 6m | IV |
| 34 | National Certificate - Landscaping Development Assistant<br>උද්‍යාන සංවර්ධන සහකාර - ජාතික සහතිකය | 6m | III |
| 35 | National Certificate - Landscaping Technician<br>උද්‍යාන අලංකරණ තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | 6m | IV |
| | **ලෝහ සහ ලුහු ඉංජිනේරු** | | |
| 36 | National Certificate - Welder<br>පෑස්සුම් ශිල්පි - ජාතික සහතිකය | 6m/12m | III/IV |
| 37 | National Certificate - Welder (GAS/ARC/TIG/MAG)<br>පෑස්සුම් ශිල්පි (GAS/ARC/TIG/MAG) - ජාතික සහතිකය | 12m | IV |
| 38 | National Certificate - Machinist (CNC Milling and Lathe Operator)<br>යන්ත්‍ර ශිල්පි (CNC Milling and Lathe) - ජාතික සහතිකය | 6m | IV |
| | **කෘෂිකර්ම සහ වැවිලි පශු සම්පත්** | | |
| 39 | National Certificate - Field Assistant (Agriculture)<br>ක්ෂේත්‍ර සහයක (කෘෂිකර්ම) - ජාතික සහතිකය | 6m | IV |
| 40 | National Certificate - Plant Nursery Development Assistant<br>පැළතවාන් සංවර්ධන සහයක - ජාතික සහතිකය | 6m | IV |
| | **රෙදිපිළි හා ඇඟලුම්** | | |
| 41 | National Certificate - Apparel Design Technician<br>ඇඟලුම් නිර්මාණ තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | 12m | IV |
| 42 | National Certificate - Batik Artist<br>බතික් නිර්මාණ ශිල්පි - ජාතික සහතිකය | 6m | III |
| 43 | National Certificate - Dress Maker/Tailor<br>ඇඳුම් මැසීම - ජාතික සහතිකය | 6m | III/IV |
| 44 | National Certificate - Pattern Maker<br>මෝස්තර නිර්මාණ ශිල්පි - ජාතික සහතිකය | 6m | IV |
| 45 | National Certificate - Tailor (Gents)<br>ඇඳුම් මැසීම (පිරිමි) - ජාතික සහතිකය | 6m | III/IV |
| 46 | National Certificate - Work Study Officer<br>වැඩ අධ්‍යයන නිලධාරි - ජාතික සහතිකය | 6m | IV |
| 47 | National Certificate - Industrial Sewing Machine Mechanic<br>අධිවේගී මහන යන්ත්‍ර කාර්මික ශිල්පි - ජාතික සහතිකය | 6m | III/IV |
| 48 | National Certificate -Industrial Sewing Machine Operator<br>අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 4m | III |
| 49 | National Certificate -Quality Assurance Supervisor (Apparel Production)<br>තත්ත්ව සහතික සුපරීක්ෂක (මැහුම්) - ජාතික සහතිකය | 6m | IV |
| 50 | National Certificate - Screen Printer<br>තිර මුද්‍රණකරු - ජාතික සහතිකය | 6m | III |
| 51 | National Certificate -Production Supervisor (Sewing)<br>නිෂ්පාදන සුපරීක්ෂක (මැහුම්) - ජාතික සහතිකය | 6m | IV |
| | **පුද්ගල හා සමාජ** | | |
| 52 | National Certificate -Beautician<br>රූපලාවන්‍ය ශිල්පි - ජාතික සහතිකය | 4m | IV |

| පාඨමාලා අංකය | වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා | පාඨමාලා කාලය | NVQ Levels |
|---|---|---|---|
| 53 | National Certificate - Child Caregiver<br>ළමා සුරැකුම් - ජාතික සහතිකය | 6m | IV |
| 54 | National Certificate -Preschool Teacher (Early Childhood Development)<br>පෙර පාසල් ගුරු - ජාතික සහතිකය | 12m | IV |
| 55 | National Diploma - Cosmetology | 840 Hrs | V |
| | මුද්‍රණ සහ ඇසුරුම් | | |
| 56 | National Certificate -Book Binder<br>පොත් බැඳීමේ - ජාතික සහතිකය | 6m | III |
| 57 | National Certificate -Offset Machine Operator<br>ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | 6m | III/IV |
| | ශීතකරණ හා වායු සමීකරණ | | |
| 58 | National Certificate -Refrigeration and Air Conditioning Technician<br>ශීතකරණ හා වායු සමීකරණ තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | 12m | IV |
| | වෙනත් | | |
| 59 | Diploma in Industrial Management<br>කාර්මික කළමනාකරණ ඩිප්ලෝමාව | 6m | Non |
| | පුද්ගල හා සමාජ | | |
| 60 | National Certificate -Caregiver (Elderly Care)<br>සත්කාර සේවා (වැඩිහිටි) | 6m | IV |
| | දැව ආශ්‍රිත | | |
| 61 | National Certificate -Wood Carving Artist<br>ලී කැටයම් ශිල්පි - ජාතික සහතිකය | 6m | III |
| 62 | National Certificate -Wood Craftsman (Building)<br>දැව තාක්ෂණ ශිල්පි (ගොඩනැගිලි) - ජාතික සහතිකය | 6m | III |
| 63 | National Certificate -Wood Craftsman (Furniture)<br>දැව තාක්ෂණ ශිල්පි (ගෘහ භාණ්ඩ) - ජාතික සහතිකය | 6m/12m | III/IV |
| 64 | National Certificate -Wood Craftsman (Furniture) with relavent Aluminium Modules | 6m/12m | III/IV |
| 65 | National Certificate -Wood Craftsman (Building) with relavent Aluminium Modules | 6m | III |
| | සම් ආශ්‍රිත නිෂ්පාදන | | |
| 66 | National Certificate -Footwear Craftsman<br>පාවහන් ශිල්පි - ජාතික සහතිකය | 6m | III |
| | මැණික් හා ස්වර්ණාභරණ | | |
| 67 | National Certificate - Jewellery Stone Setter<br>ස්වර්ණාභරණ ගල් ඇල්ලීමේ ශිල්පි - ජාතික සහතිකය | 6m | III |
| | විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ | | |
| 68 | National Certificate - Electric Motor Winder<br>විදුලි මෝටර් එතුම් ශිල්පි - ජාතික සහතිකය | 6m | III |
| 69 | National Certificate - Electrical Appliance Maintenance Technician<br>විදුලි උපකරණ නඩත්තු තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | 6m | III |
| 70 | National Certificate - Electrician<br>විදුලි ශිල්පි - ජාතික සහතිකය | 6m | III |

| *පාඨමාලා අංකය* | *වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ක්‍රියාත්මක පාඨමාලා* | *පාඨමාලා කාලය* | *NVQ Levels* |
|---|---|---|---|
| 71 | National Certificate - Mobile Phone Repairer<br>ජංගම දුරකතන අලුත්වැඩියා ශිල්පි - ජාතික සහතිකය | 6m | III |
| 72 | National Certificate - Solar Photovoltaic Systems Technician<br>සූර්ය බල පද්ධති තාක්ෂණ ශිල්පි - ජාතික සහතිකය | 6m | IV |

12 - 09

---

## සංශෝධනයයි

### මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය

### ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2024/2025

2024.11.01 දින අංක 2409 දරන *ගැසට් පත්‍රයේ* 11-52 නිවේදනයේ සඳහන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවේ 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය **2024.12.16** දක්වා දීර්ඝ කර ඇත. ඒ අනුව, මේ වන විටත් පාඨමාලාව සඳහා අයදුම් කිරීමට නොහැකි වූ අයදුම්කරුවන් හට **2024.12.16 දින** දක්වා අයදුම්පත් යොමු කිරීමට හැකියාව ඇත.

2024.11.01 දින අංක 2409 දරන *ගැසට් පත්‍රයේ* 11-52 නිවේදනයේ සඳහන් අනෙකුත් සියලුම කරුණු එලෙසම බලපැවැත්වෙනු ඇත.

වැඩි විස්තර සඳහා http://www.itum.mrt.ac.lk දරන මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

අධ්‍යක්ෂ,
මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය.

12 - 81

---

## 2024.11.22 දින ගැසට් පත්‍රය සංශෝධනය කිරීම

### කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

2024.11.22 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2412 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකල කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ හා කාර්මික විද්‍යාලවලට 2025 වසර සඳහා සිසුන් ඇතුළත් කරගැනීම සඳහා වූ *ගැසට්* නිවේදනයට පහත සඳහන් සංශෝධන සිදුකෙරේ.

එස්.සී ජගත්,
අධ්‍යක්ෂ ජනරාල්.

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම* | *සංශෝධනය විය යුතු ආකාරය* |
|---|---|---|---|
| 20. | G50S002F4.3 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>AUTOMOBILE ELECTRICIAN<br>පූර්ණ කාලීන, අවුරුදු 01 $^1/_2$ | පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් කළුතර කාර්මික විද්‍යාලය ඇතුළත් වේ. |

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම* | *සංශෝධනය විය යුතු ආකාරය* |
|---|---|---|---|
| 22. | G50S001F4.2 | මෝටර් රථ වායු සමන කාර්මික ශිල්පී<br><br>AUTOMOBILE AIR CONDITIONING TECHNICIAN | පූර්ණ කාලීන අවුරුදු 01 ක පාඨමාලාවක් ලෙස සංශෝධනය කෙරේ. |
| 34. | E41S001F4.4 | ජලනල කාර්මික ශිල්පී<br><br>PLUMBER<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01 | NVQ මට්ටම 4 පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් රත්නපුර තාක්ෂණ විද්‍යාලය ඇතුළත් වේ. |
| 45. | F45S018F4.1 | බහුකාර්ය ඉදිකිරීම් ශිල්පී (ඉදිකිරීම්)<br><br>MULTI SKILLED TECHNICIAN<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01 | NVQ මට්ටම 4 පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් මහනුවර තාක්ෂණ විද්‍යාලය ඇතුළත් වේ. |
| 64. | K72S004P4.2 | තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී<br><br>(INFORMATION AND COMMUNICATION TECHNICIAN)<br><br>අර්ධ කාලීන, අවුරුදු 01 | ඇතුළත්වීමේ සුදුසුකම් ලෙස -<br><br>1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් මාධ්‍ය භාෂාව හා ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.<br>*හා*<br><br>අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නියුක්තව සිටිය යුතුය.<br><br>*හෝ*<br><br>අවසාන විභාගයට පෙර අදාළ ක්ෂේත්‍රයේ මාස 06 ක රැකියා පුහුණුවක් ලබා තිබිය යුතුය. |
| 73. | E40S001F3.5 | විදුලි කාර්මික ශිල්පී<br><br>ELECTRICIAN<br><br>පූර්ණ කාලීන, මාස 06 | පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් බලපිටිය කාර්මික විද්‍යාලය ඇතුළත් වේ. |
| 96. | D28S002F4.2 | වායු හා චාප පෑස්සුම්කරු<br><br>WELDER<br><br>පූර්ණ කාලීන අවුරුදු 01 | NVQ මට්ටම 4 පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් රත්නපුර තාක්ෂණ විද්‍යාලය ඇතුළත් වේ. |
| 106. | F45S004F4.2 | ලී වැඩ කාර්මික (ගොඩනැගිලි)<br><br>WOOD CRAFTSMAN (BUILDING)<br><br>පූර්ණ කාලීන අවුරුදු 01 | පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් රත්මලාන කාර්මික විද්‍යාලය ඇතුළත් වේ. |

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම* | *සංශෝධනය විය යුතු ආකාරය* |
|---|---|---|---|
| 132 A | D15S001F4.1 | පළතුරු හා එළවළු සැකසුම්කරු<br><br>(FRUIT AND VEGETABLE PROCESSOR)<br><br>පූර්ණ කාලීන, මාස 06 | ඇතුළත්වීමේ සුදුසුකම් ලෙස -<br><br>1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.<br><br>NVQ මට්ටම 4 පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් මහනුවර තාක්ෂණ විද්‍යාලය ඇතළත් වේ. |
| 135. | N85S022P4.1 | සාත්තු සේවක (වැඩිහිටි)<br>Care Giver (Elder) | මෙය අර්ධ කාලීන මාස 06 ක පාඨමාලාවක් ලෙස සංශෝධනය කෙරේ. |
| 159. | F45T001F5.0 | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01 $^1/_2$<br><br>CONSTRUCTION TECHNOLOGY | පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් රත්නපුර තාක්ෂණ විද්‍යාලය ඇතුළත් වේ. |
| 180. | A01T003F5.1 | කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව<br><br>AGRICULTURAL PRODUCTION TECHNOLOGY<br><br>පූර්ණ කාලීන,<br>අවුරුදු 01 $^1/_2$ | ඇතුළත්වීමේ අමතර සුදුසුකම් ලෙස -<br><br>අ.පො.ස උ/පෙළ කලා විෂය ධාරාවෙන් කෘෂිකර්මය විෂය ඇතුළුව විෂයන් තුනක් සමත් වී තිබීම.<br><br>NVQ මට්ටම 5 පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් මහනුවර තාක්ෂණ විද්‍යාලය ඇතුළත් වේ. |
| 182. | A01T003P5.1 | කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව<br><br>AGRICULTURAL PRODUCTION TECHNOLOGY<br><br>අර්ධ කාලීන අවුරුදු 01 | ඇතුළත්වීමේ අමතර සුදුසුකම් ලෙස -<br><br>අ.පො.ස උ/පෙළ කලා විෂය ධාරාවෙන් කෘෂිකර්මය විෂය ඇතුළුව විෂයන් තුනක් සමත් වී තිබීම. |
| 201. | M80T003F5.0 | දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>TEACHING ENGLISH AS A SECOND LANGUAGE<br><br>පූර්ණකාල දිවා අවුරුදු 01 | පැවැත්වෙන විද්‍යාලයක් වශයෙන් කුලියාපිටිය කාර්මික විද්‍යාලය ඇතුළත් වේ. |

***අනෙකුත් සංශෝධන :***

ආහාර තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලවේ NVQ මට්ටම 5 සහ 6 ඒකාබද්ධ පාඨමාලාවක් ලෙස 2025 අධ්‍යයන වර්ෂයේ ආරම්භවන අතර අවශ්‍යතාවය මත NVQ මට්ටම 5 අවසානයේ එම මට්ටමට අදාළව සහතික පත්‍රය ලබාගෙන පාඨමාලාවෙන් ඉවත් විය හැක.

12 - 166

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.